**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය - 2022**

**---------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාව, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 32 ඡේදය අනුව අස්ථිත්වයක් විසින් ප්‍රමිතියක් මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් සහ වගකීම් හිලව් නොකළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුමේ පැවති රු.25,932,669ක අවාසි සහගත ශේෂය මුදල් හා මුදල් සමාන දැ වලින් අඩුකර දැක්වීම හේතුවෙන් මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අරමුදල් කළමනාකරණ ගිණුමේ ඇති ශේෂය මඟින් මෙම ගිණුම ආවරණය කරනු ලබන බැවින් එකම ගිණුමේ පවත්නා අරමුදල් පදනම් කරගනිමින් අදාළ ශේෂය සෑදි ඇත. එබැවින් මුදල් හා මුදල් සමාන දෑවල වටිනාකම අඩු කර දැක්වීමක් සිදු කර නොමැති බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව හා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතමයන්හි සත්‍ය හා සාධාරණ වටිනාකම පෙන්වන ආකාරයට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 60 ඡේදය ප්‍රකාරව ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් වෙන්කර දැක්විය යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළී ආදායම රු.2,089,671,823ක් හා ස්ථාවර තැන්පතු වටිනාකම රු.21,038,312,191ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් ලෙස වෙන්කර දැක්වීමකින් තොරව එකතුව රු.23,127,984,014ක ස්ථාවර තැන්පතු ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | ලැබිය යුතු පොලී ආදායම මූල්‍ය වත්කම්හි කොටසක් වන අතර වෙනත් ලැබිය යුතු ආදායමක් නොවේ. එබැවින් පෙර සියලු වර්ෂයන්හි ද මේ ආකාරයට මූල්‍ය වත්කම්හි කොටසක් ලෙස ලැබිය යුතු පොළී ආදායම දක්වා ඇත. ඒ අනුව කාර්යාංශය විසින් නිවැරදිව ගිණුම් වල දැක්වීමක් සිදු කර ඇති බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් වෙන් වෙන් වශයෙන් දැක්විය යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7හි 28 ඡේදය ප්‍රකාරව විදේශ ව්‍යාවහාර මුදල්වල විනිමය අනුපාතයන්ගේ වෙනස්වීම නිසා පැන නගින උපලබ්ධි නොවූ හානි සහ වාසි පමණක් මුදල් ප්‍රවාහයන් ලෙස හඳුනාගත යුතු නමුත්, කාර්යාංශය විසින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් | 2023 වර්ෂයේ දී විගණනය විසින් පෙන්වා දී ඇති නිරීක්ෂණ නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී උපලබ්ධි නොවූ විදේශ විනිමය හුවමාරු ලාභය පමණක් බදු පෙර ලාභයට ගැලපීමට |

| | | | |
|---|---|---|---|
| | ප්‍රවාහයන් ගණනය කිරීමේදී උපලබ්ධි වූ විදේශ විනිමය හුවමාරු ලාභයද ඇතුළත්ව සම්පූර්ණ විදේශ විනිමය හුවමාරු ලාභය (exchange gain) ලෙස රු.1,606,547,459ක් බදු පෙර ලාභයට ගලපා තිබුණි. | | කටයුතු කළ යුතුය. |
| (ඈ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම ගැලපීමේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් ණයහිමියන් තුළ ඇතුළත් නොවූ රු.209,375,755ක් ගලපා තිබුණි. | පෙන්වා දී ඇති නිරීක්ෂණ නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී කාරක ප්‍රග්ධන වෙනස්වීම් හඳුනාගෙන නිවැරදිව ගැලපීම් කළ යුතුය. |
| (ඉ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ආයෝජන මිලදී ගැනීම සහ විකිණීම , මුදල් ගලායාම් සහ මුදල් ගලාඒම් ලෙස දැක්විය යුතු නමුත් ආයෝජනය කළ වර්ෂයේ ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස දක්වා තිබුණි. | පෙන්වා දී ඇති නිරීක්ෂණ නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කරන බව. | වර්ෂය තුළදී මුදලින් සිදුවූ ගලාඒම් සහ ගලායාම් නිශ්චිතව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 47 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ බදු අනුපාතයට අනුව විලම්භිත බදු ගණනය නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විලම්භිත බදු වත්කම් රු.4,010,206ක් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයට අදාළ ආදායම් බදු රු.1,700,711,809ක් වුවද ගණනය කළ බදු වටිනාකම රු.1,704,722,015ක් විය. | මෙය ප්‍රවර්ථන වර්ෂයේ බදු වෙන් කිරීම් දෝෂයක් වන අතර එය ඉදිරි වර්ෂයේ නිවැරදි කිරීමට අපේක්ෂා කරන බව. | අදාළ බදු අනුපාතය නිවැරදිව හඳුනාගෙන විලම්භිත බදු වටිනාකම ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතම සඳහා සෑම වර්ෂ 03කට හෝ 05කට වරක් ප්‍රත්‍යාගණනයක් සිදු කළයුතු වුවත් කාර්යාංශය විසින් 2010 වර්ෂයෙන් පසු වත්කම් සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනයක් සිදු කර නොතිබුණු බැවින් ස්ථාවර වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන මඟින් නිරූපනය නොකෙරුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය පිළිගත් ආයතනයක් මගින් සිදු කිරිම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතින බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල වත්කම් සඳහා සාධාරණ වටිනාකමක් පෙන්නුම් කළ යුතුය. |
| (ඌ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය මිලියන 1262.16 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතිණි. ඒ අනුව වත්කම්වල ඵලදායී ජීව කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 අනුව නැවත ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉහත පරිදි ප්‍රත්‍යාගණනයෙන් පසුව අදාළ ගිණුම්කරණ ගැලපුම් සිදු කිරීමට අපේක්ෂා කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කාර්යාංශය සතු වත්කම්වල නිවැරදි වටිනාකම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගමණික ශ්‍රමිකයන් පුහුණුකර ලබා දෙනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පත්‍ර (NVQ) මුද්‍රණය කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු රු.2,846,025 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මෙය 2023 වර්ෂය සඳහා ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව. | බැරකම් අදාල වර්ෂයට නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් ලෙස රු.44,490,054ක් දක්වා තිබුණද ප්‍රසම්පාදන අංශයේ ඇති උපලේඛනය අනුව එම ශේෂය රු.3,172,467ක් වූයෙන් රඳවා ගැනීමේ මුදල් රු.41,317,857ක් වැඩියෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | වැඩියෙන් දක්වා ඇති රඳවා ගැනීම් 2023 වර්ෂයේ දී ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | රඳවා ගැනීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කල යුතුය. |
| (ඇ) | කම්කරු සුභසාධන අරමුදලට හා කුවේට් වන්දි අරමුදල්වලට අදාළ ස්ථාවර තැන්පතු කල් පිරීමේදී හා නැවත ආයෝජනය කිරීමේදී එදිනට පැවති විදේශ විනිමය අනුපාතයට අනුව විදේශ විනිමය හුවමාරු ලාභය හෝ අලාභය හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විදේශ විනිමය හුවමාරු ලාභය රු.5,581,297ක් අඩුවෙන් දක්වා තිබුණු අතර මේ හේතුවෙන් වර්ෂයේ අතිරික්තයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | කාර්යාංශය විසින් ගිණුම්ගත කර ඇති විදේශ විනිමය හුවමාරු ලාභය නිවැරදි බව. | අදාළ දිනයන්හි පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතය පදනම් කරගෙන ලාභය හෝ පාඩුව ගණනය කර ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශගත වන ශ්‍රමිකයින් වෙනුවෙන් නොමිලේ ලබා දෙන රක්ෂණාවරණය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග එළඹ තිබූ ගිවිසුමේ 4 ඡේදය ප්‍රකාරව පරිපාලන වියදම් ලෙස සියයට 15ක කොමිස් මුදලක් කාර්යාංශය වෙත ලැබිය යුතු වුවද 2022 වර්ෂය සඳහා ගෙවන ලද රු.444,490,978ක වාරික මුදලින් තවදුරටත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබිය යුතු රු.60,267,876ක රක්ෂණ කොමිස් මුදල ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයට අදාළව ලැබිය යුතු කොමිස් මුදල රක්ෂණ සමාගම විසින් තහවුරු කරනු ලැබුවේ 2023.07.05 දින දීය. එබැවින් මූල්‍ය ප්‍රකාශන තුල ආදායමක් සහ ලැබිය යුතු ශේෂයක් ලෙස එය දැක්වීමක් සිදු කර නොමැති බව. | කාර්යාංශයේ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2020 වර්ෂයේදී කුවේට් හි සේවය කළ විගමණිකයින් 14 දෙනෙකුගේ ගුවන් ගමන් ගාස්තු ලෙස කාර්යාංශය විසින් දරන | 2021.08.31 වන දිනට කුවෙට් තානාපති කාර්යාලයේ සුභසාධන අංශය වෙත චෙක්පත් 04 කින් ලද | දූත මණ්ඩලවල මුදල් එක්රැස් කිරීමේදී අදාල කාලපරිච්ඡේදය |

| | | | |
|---|---|---|---|
| | ලද රු.2,951,091ක මුදල 2021 වර්ෂයේදී ගල්ෆ් රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කිරීමේදී ඒකාබද්ධ අරමුදලට ගැලපීම වෙනුවට ගෙවිය යුතු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | කුවේට් ඩිනාර් 2488 ක් (එදිනට වටිනාකම රු.1,737,256.95) ක මුදල කාර්යාංශය විසින් ශ්‍රමිකයන් 14 දෙනෙකු වෙනුවෙන් දරන ලද ගුවන් ගමන් ගාස්තු ප්‍රතිපූරණය කිරීම සඳහා GIC රක්ෂණ සමාගමෙන් හිමි වූවක් බව. | නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (ඊ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සුභසාධන අරමුදලේ ගෙවිය යුතු ශේෂ තුළ දැනටමත් ගෙවා ඇති රු.3,708,962ක් නැවත ගෙන්වා ගැනීමේ තැන්පතුවල ඇතුළත් වීමෙන් උපචිත හා වෙනත් ගෙවිය යුතු ශේෂ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම්කරණ දෝෂයන් නිවැරදි කිරීමට විදේශ සම්බන්ධතා අංශය සමඟ අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | ගිණුම්කරණ දෝෂ නිවැරදි කර ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකල යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා ගෙවිය යුතු ණයහිමි ශේෂ (1576කට අදාලව ) | 376,748,580 | ශේෂ තහවුරු කිරීමේ ලිපි | 2022.09.30 දිනට ශේෂ තහවුරු කිරීමේ ලිපි යොමුකර ඇති බව. | සෑම වසරකම අවසානයට පවතින ශේෂය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2012 වර්ෂයටත් පෙර සිට පැවත එන ලැබිය යුතු තැන්පත් ශේෂ | 1,000,000 | තැන්පතුවට අදාළ සහතිකය | අදාළ පාර්ශව විසින් මෙම ශේෂ පිළිබඳව කරුණු දැක්වීමක් සිදු කර නොතිබුණි. නමුත් අදාළ ශේෂය මේ දක්වා ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පවත්වා ගැනිම සිදුකර ඇත. ඉදිරියේ දී නැවත මෙම ශේෂය පියවීම පිළිබඳ විමසීමක් සිදු කිරීමට කටයුතු යොදනු ලබන බව. | අදාළ පාර්ශවයෙන්ගෙන් ශේෂ තහවුරුවක් ලබාගෙන ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂය | 869,955,802 | ශේෂ තහවුරු ලිපිය | | |
| (ඈ) | සුභසාධක අරමුදල මඟින් කාර්යාංශය වෙත ලැබිය යුතු ශේෂය | 1,512,657,528 | ලැබීම්වලට අදාළ උපලේඛන හා ශේෂ තහවුරු කිරීම් | කාර්යාංශය ආරම්භයේ සිට සුබසාධන අරමුදල සඳහා අවශ්‍ය අවස්ථාවලදී කාර්යාංශ අරමුදල විසින් මුදල් ප්‍රේෂණය කර ඇති අතර සුබසාධන අරමුදල මඟින් කාර්යාංශය වෙත නොපියවා ඇති ශේෂය ලෙස ඉහත මුදල සැලකිය හැකි බව. | කම්කරු සුභසාධනය සඳහා පමණක් වන ලැබීම් හා ගෙවීම් නිශ්චිතව හඳුනා ගෙන ගිණුම් තැබිය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව කාර්යාංශයේ විශේෂ විමර්ශන ඒකකයට ලැබෙන පැමිණිලි විමර්ශනයෙන් පසුව පැමිණිලිකරුවන් වෙත ගෙවීම සඳහා මුදල් වංචා කළ පුද්ගලයින්ගෙන් හා රැකියා නියෝජිත ආයතනවලින් අයකරගත් රු.21,649,779ක මුදලක් පැමිණිලිකරුවන් වෙත නොගෙවා කාර්යාංශ ගිණුමේ රඳවාගෙන තිබුණු අතර ඉන් වසර 2ත් වසර 09ත් අතර කාලයක සිට පැවත එන රු.20,079,603ක ශේෂයන් පැවතුණි. මෙම මුදල් ලැබුණු බවට පැමිණිලිකරුවන් දැනුවත් කිරීමකින් තොරව පැමිණිලි කටයුතු අවසන් කර ලිපිගොනුව වසා දැමීම මෙයට හේතුව ලෙස විගණනයේදී අනාවරණය විය. | මෙම මුදල් ආදාළ පැමිණිලිකරුවන්ගේ පැමිණිලි නිරාකරණය වූ පසු ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම් තබා ඇත. ඉහත ශේෂයන් අතුරින් 2018 වර්ෂය දක්වා නිරාකරණය නොවූ ශේෂයන් 2023 වර්ෂයේ ආදායමට ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. අනෙකුත් ශේෂයන් නිරවුල් කිරීමට විමර්ශන අංශය සමඟ අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | අදාළ පැමිණිලි විසඳූ වහාම එම අයකරගත් මුදල් අදාළ පැමිණිලිකරුවන් වෙත ගෙවීම් කිරීමට අදාළ ක්‍රමවේදයක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මියගිය විගමණික ශ්‍රමිකයින් 157 දෙනෙකු වෙත මරණ වන්දි වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබී තිබූ රු.47,995,092ක් ඔවුන් වෙත ගෙවීම් නොකර සුබසාධක අරමුදලේ ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි. තවද, ගිණුම් අංශය හා සුභසාධන අංශය අතර සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව ගිණුම් අංශය වෙත ලැබී තිබුණු හිමිකම් ඉල්ලීම් 81ක් වෙනුවෙන් රු.22,539,765කට අදාළව තොරතුරු සුභසාධන අංශයේ නොතිබුණු අතර සුභසාධන අංශය වෙත ලැබී තිබුණු මරණ වන්දි 9ක් වෙනුවෙන් රු.4,282,435කට අදාළ තොරතුරු ගිණුම් අංශයේ නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මරණ වන්දි ලිපිගොනු විධිමත්ව පවත්වා ගෙනයා යුතු අතර අවශ්‍ය ලිපිලේඛන පිළිබඳව වන්දි ඉල්ලුම්කරුවන් නිසි පරිදි දැනුවත් කළ යුතුය. රක්ෂණ වන්දි ලැබුණු වහාම එම වන්දි මුදල් ගෙවා නිම කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |
| (ඇ) | සුරැකුම් නිවාසවලට ශ්‍රමිකයන් භාර ගන්නා අවස්ථාවේදී ඔවුන් සතු හා ඔවුන් සේවය කළ නිවැසියාගෙන් ලැබෙන මුදල් ආරක්ෂිත ගිණුමේ (Safe Account Deposit) තැන්පත් කර ලංකාවට පැමිණීමෙන් පසු එය ගෙවිය යුතු | 2022.12.31 වන දිනට ගෙවිය යුතු ශේෂය ලෙස විගණන විමසුමෙහි දක්වා ඇති රු.81,728,897 මුදල අවසන් ගිණුම් සමඟ එකඟ වන බව. | මෙම මුදල් ආදායමට ගැනීමට පෙර අදාළ පාර්ශවයන් දැනුවත් කර ගෙවීම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වුවත් 2022 දෙසැම්බර් 31 දිනට එසේ රු.81,728,897ක ශේෂයක් නොගෙවා එම ගිණුමේ රඳවාගෙන තිබුණි. | | |
| (ඈ) | දකුණු කොරියාවේදී අනතුරකට ලක්වී සිටි ශ්‍රමිකයෙකු නැවත ලංකාවට ගෙන්වා ගැනීම සඳහා 2019 නොවැම්බර් 08 වන දින කාර්යාංශය වෙත තැන්පත් කරන ලද මුදලින් වැය නොවී ඉතිරිවී තිබූ රු.1,451,490ක් නැවත ඔවුන් වෙත ගෙවිය යුතු වුවද වසර 3ක් ඉකුත් වී තිබුණ ද එම මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මෙම ගෙවිය යුතු මුදල කෙටි කාලයක් තුළ ගෙවා නිම කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

### 1.6.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත | | | |
| i. 17(2) වගන්තිය සහ 45(2) වගන්තිය | පනතෙහි සඳහන් විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස කාර්යාංශය විසින් කාර්යාංශ අරමුදලට එක්රැස් විය යුතු ආදායම් කම්කරු සුභසාධන අරමුදලට එක්රැස් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ එම ආදායම්වල එකතුව රු.3,494,022,254ක් වී තිබුණි. | කාන්තා විගමණික සේවකයින්ගේ ආරක්ෂාව හා සුභසාධනය සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය අනුව 1998 ජුනි 03 වන දින අංක 98/783/32/017 දරන කැබිනට් මණ්ඩල අනුමැතිය සහිතව විදේශිය සේවක සුභසාධන අරමුදල පිහිටුවා ඇත. ඉහත කැබිනට් නියෝග සහ විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 01/1999 දරණ ගිණුම් චක්‍රලේඛ අනුව ආදායම් අයකිරීම සහ වියදම් දැරීම සිදු කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කම්කරු සුභසාධන අරමුදලට අදාළ ආදායම් පමණක් ඇතුළත් කළ යුතුය |
| ii. 17(3) වගන්තිය සහ 48(1) වගන්තිය | පනතෙහි සඳහන් විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස කාර්යාංශ අරමුදලින් ගෙවිය යුතු විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා අනුයුක්ත කරන ලද කාර්යාංශ කාර්යමණ්ඩලවලට අදාළ වැටුප් සහ වෙනත් දීමනා සඳහා එකතුව රු.684,351,761 ක් කම්කරු සුභසාධන අරමුදලෙන් සමාලෝචිත වර්ෂය තුළදී වැය කර තිබුණි. | | පනතේ විධිවිධාන ප්‍රකාරව කම්කරු සුභසාධනය සඳහා පමණක් වැය වන වියදම් ඇතුළත් කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2021 ඔක්තෝබර් 14 හා 2022 පෙබරවාරි 10 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපි | චක්‍රලේඛයට පටහැනිව 2002 වර්ෂයේ ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත දීමනා ඇතුළත් දළ වැටුප මෙන් 12 ගුණයක් ආපදා ණය ලෙස ගෙවීමට කාර්යාංශය විසින් කටයුතු කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 525 දෙනෙකු වෙත සීමාව ඉක්මවා එකතුව රු.67,673,231ක් ආපදා ණය ලෙස ගෙවා තිබුණි. තවද ක්ෂණික ණය ලෙස නිලධාරියකුගේ මාසයකට සමාන වැටුපක් සියයට 4.2 පොළී අනුපාතයක් යටතේ නිලධාරීන් 107 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,826,900ක් ගෙවීම් කර තිබුණි. | පනතේ 16(2) ඉ හා ඊ උපවගන්ති ප්‍රකාරව ලැබී ඇති බලතල අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කාර්ය මණ්ඩලය වෙත 1995.05.01 දින සිට ආපදා ණය මුදල ලබාදීම සිදු කරනු ලබයි. 2008.12.31 වන දින නිකුත්කර ඇති 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය එපරිද්දෙන්ම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වලට අදාළ කර ගත හැකිද යන්න පිළිබඳ පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙස 2022.10.26 වන දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇති බව. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් චක්‍රලේඛයෙහි සඳහන් සීමාව ඉක්මවා ණය ලබාදීම සිදු කළ නොහැකි බව කාර්යාංශය දැනුවත් කර ඇති බැවින් ඊට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ XLV(III) පරිච්ඡේදයේ 12 වන වගන්තිය | කාර්යාංශයේ සේවය කරමින් සිටි නිලධාරීන් දෙදෙනෙකුට විරුද්ධව විනය පරීක්ෂණය කෙරෙමින් පැවතියද ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව විදේශ දූත මණ්ඩලවල පිහිටි සුභසාධක අංශයේ සේවය සඳහා ඩුබායි හා කුවේට් රටවල්හි පිළිවෙලින් උපදේශක හා පළමු ලේකම් තනතුරු සඳහා 2021 වර්ෂයේදී ඔවුන් බඳවා ගෙන තිබුණි. | අදාළ නිලධාරීන් දෙදෙනා දූත මණ්ඩල සේවය සඳහා අනුයුක්ත කරනු ලබන අවස්ථාව වන විට ඔවුන්ට එරෙහිව කිසිඳු විනය චෝදනාවක් නොපැවති බැවින් ඔවුන් දූත මණ්ඩල සේවය සඳහා අනුයුක්ත කරනු ලැබීය. | පවත්නා නීතිරීති, චක්‍රලේඛවලට අනුගතව කටයුතු කළ යුතු අතර, සුදුසුකම් සහිත කාර්යය මණ්ඩලය විධිමත් පරිදි බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2020 ජනවාරි 14 දිනැති සභාපතිගේ 2020/01චක්‍රලේඛය | i. චක්‍රලේඛ කොන්දේසි පදනම් කරගෙන විදේශ දූත මණ්ඩල සේවය සඳහා කාර්යාංශයේ කාර්යය මණ්ඩලයේ අයදුම්පත් ප්‍රතික්ෂේප කර තිබුණු නමුත් චක්‍රලේඛ කොන්දේසි සපුරා නොතිබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙස | 2018 වර්ෂයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කර නොමැත. 2018 වර්ෂයේදී තේරී පත් වූ අදාළ නිළධාරිනිය 2022.06.22 ලබා දී තිබූ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය යටතේ විදේශ දූත මණ්ඩල සේවය සඳහා අනුයුක්ත කර ඇත. අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගන්නා දින වන | බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරවාගෙන ඒ අනුව බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු කළ කාර්යාංශයේ නිලධාරිනියක් ඩුබායි තානාපති කාර්යාලයේ කම්කරු සුහසාධන අංශයේ උපදේශක තනතුර සඳහා පත්කර තිබුණි. | විට පළමු වර දූත මණ්ඩල සේවයේ යෙදී ලංකාවට පැමිණ වසර 03 ක කාල සීමාව සම්පූර්ණ කර ඇති බව. | |
| ii. | චක්‍රලේඛය අනුව ඉල්ලුම් කිරීමට අවශ්‍ය අවම වයස් සීමාව සම්පූර්ණ වී නොතිබීම හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණු අයදුම්කරුවෙකු සිංගප්පූරු තානාපති කාර්යාලයේ සුභසාධක අංශයේ උපදේශක තනතුර සඳහා බඳවාගෙන තිබුණි. | සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ රැකියා හා සුබ සාධන අංශයේ උපදේශක තනතුර සඳහා තෝරාගත් එන්.එම්.තිබ්බුටුමුණුව මහතා එම තනතුර සඳහා අනුයුක්ත කරන දින වන විට (පත්වීම් ලිපි දිනය 2021.05.21) ඔහුගේ අවම වයස් සීමාව සම්පූර්ණ කර තිබුණු බව. | බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරවාගෙන ඒ අනුව බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අබුඩාබි තානාපති කාර්යාලයේ කම්කරු සුබසාධන අංශයේ කාර්යමණ්ඩල සාමාජිකයෙකු විසින් සිදුකරන ලද රු.1,149,258ක මුදල් අක්‍රමිකතාව සහ කාර්යාංශයේ කළමනාකරුවෙකු විසින් සිදු කරන ලද රු.3,638,368ක මුදල් අවභාවිතය සිදු කර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 9 ක් ගත වී ඇතත් එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ අයට විරුද්ධව අධි චෝදනා පත්‍ර සකස් කර එම ගොනුව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමු කර ඇත.<br>එස්. සුරේෂ් කුමාර් මහතාට විරුද්ධව පැවති විධිමත් විනය පරීක්ෂණය අවසන් වීමෙන් පසු කාර්යාංශයේ විනය බලධාරී විසින් එකී පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ සැලකිල්ලට ගනිමින් 2022.01.10 දිනැති ලිපිය මගින් එම මහතා කාර්යාංශ සේවයෙන් පහ කර ඇත. ඒ අනුව, මොහුගෙන් තවදුරටත් රු.3,638,368.10 ක මුදලක් අයවීමට ඇති බැවින් එම මුදල අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට කාර්යාංශයේ නිති අංශය විසින් 2023.02.23 වන දින නිතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් අදාළ නීතිමය පියවර ගනිමින් සිටින බව. | මුදල් අක්‍රමිකතා සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ හා විධිමත් විනය පරීක්ෂණ සිදු කිරීම ඉතා දුර්වල මට්ටමක පවතින බැවින් විනය පරීක්ෂණ කටයුතු කඩිනම් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ හා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.6,123.303,917ක සහ 6,085,612,304 ක බදු පසු ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.880,154,212ක සහ 895,481,128ක බදු පසු ලාභයක් වී තිබුණි. ඒ අනුව සමූහයේ හා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.5,243,149,705කින් සහ රු.5,190,131,176 කින් වර්ධනයක් නිරීක්ෂණය විය. විදේශ දූත මණ්ඩල ආදායම, විගමණිකයින්ගේ ලියාපදිංචි ආදායම , සෙස් බදු ආදායම හා

ස්ථාවර තැන්පතු පොළී ආදායම වැඩිවීම සහ විදේශ විනිමය හුවමාරු ලාභය වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

(අ) 2021 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විදේශගතවීම් සියයට 154ක වර්ධනයක් පෙන්නුම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දූත මණ්ඩල ලැබීම් ආදායම රුපියල් මිලියන 2,730කින් වර්ධනය වී තිබුණු අතර එය සමස්ථ ආදායමින් සියයට 31.5ක් වී තිබුණි.

(ආ) 2022 හා 2021 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 23,251ක් හා රු.මිලියන 10,603ක් ආයෝජනය කර පිළිවෙලින් රු.මිලියන 1,859ක් හා රු.මිලියන 504ක පොලී ආදායම් උපයා තිබූ අතර එය සමස්ථ ආදායමෙන් පිළිවෙලින් සියයට 16ක් හා 17ක් වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හෝමාගම හා කහගොල්ලෙහි ඉඩම් බදු පදනම මත ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලෙස රු.46,000,000 ක් හා වෙනත් වියදම් සඳහා රු.1,719,680 ක් වශයෙන් එකතුව රු.47,719,684 ක් වැය කර තිබුණද අදාළ ඉඩම් නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් වෙනත් ආයතන විසින් එම ඉඩම් නැවත අත්පත් කර ගැනීමට කටයුතු කරමින් පැවතියද කාර්යාංශය විසින් ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කහගොල්ල ඉඩම තාවකාලිකව කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පිහිටු වීමට ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත ලබා දී ඇත. ගෙවන ලද අත්තිකාරම් මුදල ඉඩම පවරා දීමට ප්‍රථම ප්‍රතිපූර්ණය කර ලබාදෙන ලෙස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත දන්වන ලෙස ලේකම්, විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇත.<br>හෝමාගම මාහේන්වත්ත ඉඩම 2010 පෙබරවාරි 26 දින වසර 50ක කාලයකට බදු පදනම මත ලබාගෙන අදාළ දිනට ඇස්තමේන්තුගත බදු වටිනාකම වූ රු.මිලියන 52න් රු.මිලියන 26ක මුදලක් ගෙවා තිබුණු බව. | ඉඩම් කාර්යාංශය වෙත පවරා ගැනීමට හෝ ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | තංගල්ල හා මතුගම විගමණික සම්පත් මධ්‍යස්ථානවල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පිළිවෙළින් රු.302,112,904 ක් හා රු.153,686,495 ක් වැයකර තිබුණ ද ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි. | මෙම ඉඩම අමාත්‍යාංශයට පැවරීම සඳහා අමාත්‍යාංශ අතිරේක ලේකම්(සංවර්ධන) විසින් අංක MFE/DEV/PL/03/01/02 හා 2021.02.01 දිනැති ලිපිය මඟින් විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දන්වා ප්‍රාදේශීය ලේකම්, තංගල්ල වෙත දන්වා ඇති බව. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඕමාන් තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයේ තුන්වන ලේකම් ලෙස කටයුතු කළ නිලධාරියා විසින් සිදු කරන ලද අක්‍රමිකතා හේතුවෙන් සේවය අත්හිටුවා 2022 නොවැම්බර් 29 දින ලංකාවට | රැඳවුම් නිවාස පාලිකාවට එල්ලවූ චෝදනා අනුව තානාපතිතුමාගේ නිර්දේශය මත එම නිලධාරිනිය කඩිනමින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා ඇය වෙනුවට | දූත මණ්ඩල කාර්යාලයේ සේවය සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් තෝරා පත්කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැමිණීමෙන් පසුව සුදුසුකම් සපුරන ලද තුන්වන ලේකම්වරයෙකු 2023 ජූනි 20 දින දක්වා පත්කර නොතිබුණි. තවද එම තානාපති කාර්යාලයේ චෝදනාවලට ලක්වී සිටින සුරැකුම් නිවාස පාලිකාව විසින් සුරැකුම් නිවාසයට අදාළ ලිපිලේඛන නඩත්තු කර නොමැති බව 2023 ජනවාරි 31 දින තානාපතිතුමා විසින් සභාපති වෙත දන්වා තිබුණද ඒ වෙනුවට වෙනත් නිලධාරියෙකු පත්කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනුප්‍රාප්තික නිලධාරිනියක් කාර්යාංශය විසින් පත් කර යැවීමට කටයුතු සිදු කර ඇත. ඒ අනුව නව සුරක්ෂා නිවාස පාලිකා නිලධාරිනිය 2023.07.02 දින රාජකාරි භාරගත් අතර එදින සිට දින 14ක් සම්පූර්ණ වීමෙන් පසු මෙතෙක් සේවය කල සුරක්ෂා නිවාස පාලිකාව ප්‍රධාන කාර්යාල වෙත කැඳවීමට කටයුතු කරන ලෙස දන්වා තානාපතිතුමා වෙත ලිපි යොමු කර ඇති බව. | |
| (ආ) | රැකියා බලපත්‍ර ක්‍රමය (Employment Permit System) යටතේ දකුණු කොරියාව වෙත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යැවීමට අදාළව එරට රජය මැදිහත්ව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමෙහි කාලය 2019 සැප්තැම්බර් 29 දිනෙන් අවසන්වී තිබුණු අතර එම ගිවිසුමට අනුව සාධාරණ හේතුවකින් තොරව යාවත්කාලීන කිරීම ගිවිසුම් කාලය අවලංගු වී මාස 06 ක් ඉක්ම යන විටත් ප්‍රමාද වුවහොත් එම ගිවිසුම අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ හැකියාව පවතී. එසේ වුවද 2023 ජූනි 27 වන විටත් ගිවිසුම යාවත්කාලීන කර නොතිබුණි. මෙම ගිවිසුම යටතේ පසුගිය වර්ෂ 06 තුළ ශ්‍රමිකයින් 20,667 දෙනෙකු රැකියා සඳහා යොමු කිරීමේ කටයුතු කාර්යාංශය විසින් සිදුකර තිබුණි. | අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශය අනුව යාවත්කාලීන කරන ලද අවබෝධතා ගිවිසුම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් 2023.03.02 දිනැතිව නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව.<br>නීතිපතිතුමාගේ නිර්දේශ මේ වන විට ලැබී ඇති බැවින් අදාළ නිර්දේශද එකී ගිවිසුමට ඇතුළත් කරමින් කොරියානු පාර්ශවයේ එකඟතාවය ලබා ගැනිම සඳහා සංශෝධිත ගිවිසුම විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් යොමු කර ඇති බව. | රාජ්‍යයන් දෙකක් අතර ක්‍රියාත්මක මෙම රැකියා වැඩසටහනට අදාළ ගිවිසුම යාවත්කාලීන කිරිම ප්‍රමාදවීමට හේතු පරික්ෂා කර කඩිනමින් එම කටයුත්ත නිම කිරිමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1990 හා 1991 වර්ෂයන්හි ගල්ෆ් යුද්ධයෙන් රැකියා අහිමිවූවන්ට වන්දි ලබාදීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසම ශ්‍රී ලංකාවට ලබාදී ඇති වන්දි අරමුදලෙහි, වන්දි ලබා දීම 1994 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කළ යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දින වන විටත් 948 දෙනෙකු වෙත රු.251,453,848ක් වන්දි ලෙස ගෙවිය යුතුව පැවතුණි. මෙම වන්දි අරමුදල ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර 1997 සිට 2022 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා රු.4,960,937,306ක ආදායමක් උපයාගෙන ඇති අතර 2022 දෙසැම්බර් 31 වන විට, වන්දි අරමුදල රු.5,212,391,154ක් වී තිබුණි. කෙසේ වුවද 2022 දෙසැම්බර් 31 වන විටත් වන්දි ගෙවිය යුතු අය වෙත මෙම වන්දි ලබා දීමට කටයුතු කර නොතිබුණි. | තවදුරටත් ගෙවීම් සඳහා ඇත්තේ වන්දි ලාභීන් 948 ක් පමණක් වන අතර ගෙවිය යුතු වන්දි වටිනාකම රු.මිලියන 251 කි. අවස්ථා ගණනාවකදී කාර්යාංශය විසින් පුවත්පත් නිවේදන මගින් හා ලිපි මගින් වන්දි ඉල්ලීම් ලාභීන් දැනුවත් කලද පුද්ගලයන්ට වන්දි ලබා ගැනීමට නොහැකි වී ඇත.<br>ප්‍රතික්ෂේපිත වූ වන්දි ඉල්ලුම්කරුවන් අතුරින් 1692 ක් සඳහා වන්දි ගෙවීමට 2002.09.25 වන දින කැබිනට් අනුමැතිය මත ගෙවීම් කර ඇති බව. | ඉල්ලුම්කරුවන් පිළිබඳ සොයා බලා ඔවුන් වෙත කඩිනමින් ගෙවීම් කිරිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | කුවේට් වන්දි අරමුදලින් වන්දි ලබා ගැනීමට 2007 නොවැම්බර් 19 දින විගමණික ශ්‍රමිකයෙකු විසින් ඉල්ලුම් කර, සියලු ලියකියවිලි වන්දි ගෙවීමේ නිර්දේශ කමිටුව මඟින් අනුමත වී තිබියදී හා 1991 වර්ෂයේ කුවේට් යුධ සමයෙහි කුවේට්හි සේවය කළ බවට තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කර තිබියදීත් වන්දි ලබා ගැනීමේ අයදුම්පත් ඉදිරිපත් කර සමාලෝචිත වර්ෂය වන විට වසර 15ක් ගතවී ඇතත් මේ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එම ශ්‍රමිකයා වන්දි ඉල්ලා ඇති කාලය අදාළ කාල සීමාව තුලට ද අයත් නොවේ. එබැවින් එවැනි ඉල්ලීම් සඳහා මෙම අරමුදල මගින් ගෙවීම් කිරීමේ හැකියාවක් නොමැති බව. | කාර්යාංශය විසින් නිර්දේශ කර ඇති පරිදි මෙම අයදුම්කරු වෙත වන්දි ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කාර්යාංශය සතුව එකතුව රු.397,366,435ක් වටිනා ස්ථාවර තැන්පතු 07ක් බැංකු ඇපකර ලෙස තබා ගනිමින් නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වෙමින් පවතින බව සඳහන් කර තිබුණද එහි ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මහ බැංකුවේ නියෝජනයෙන් සහ වාණිජ බැංකුවල නියෝජිතයන්ගේ අදහස් ලබා ගැනීමෙන් නව ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. කුවේට් අරමුදල මගින් විගමණිකයින්ගේ සුබ සාධනය උදෙසා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාවේදී ලබා දුන් නිර්දේශවලට අනුගත වෙමින් ඉහත ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරණු ලබන බව. | දැනට පවත්නා නිවාස ණය යෝජනා ක්‍රමය සක්‍රීයව ක්‍රියාත්මක වන බැවින් කාර්යාංශයේ කළමනාකාරීත්වය විසින් ඒ පිළිබඳව සොයාබලා නැවත සක්‍රීය කර විගමණික ශ්‍රමිකයින් වෙත අවශ්‍ය සුහසාධන පහසුකම් සැලසිය යුතුය. |
| (ඊ) | 2013 ජනවාරි 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ ඒකාබද්ධව රටවිරුවෝ නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අවබෝධතා ගිවිසුමක් අත්සන් කර කාර්යාංශය විසින් 2013 මාර්තු 08 දින සමෘද්ධි අධිකාරිය වෙත රු.100,000,000ක මුදලක් ගෙවා තිබූ අතර එම මුදල සමෘද්ධි අධිකාරිය නමින් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි. අවබෝධතා ගිවිසුමේ වලංගු කාලය 2018 මාර්තු 07 දිනෙන් අවසන් වී ඇතත් ව්‍යාපෘතියට අනුව ණය ලබා දීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම පොළී ආදායමක් ද ලැබී නොතිබුණි. | රටවිරු නිවාස ණය ව්‍යාපෘතිය මේ වන විට අවසන් වී ඇතත්, නව ගිවිසුමකට එළඹී නැත. 2013/02/01 දිනැති අංක 130086/544/002 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙහි (ඇ) 38 (ii) අනුව රු.100,000,000 ක මුදලක් සමෘද්ධි බැංකුවෙහි තැන්පත් කර ඇත. ඔවුන් එම මුදල ස්ථාවර තැන්පතුවක් ලෙස අයෝජනය කර ඇතත් කාර්යංශය නමින් අයෝජනය කර නොමැත. නමුත් අපගේ තැන්පතුවට අදාළව ශේෂ තහවුරු කිරීමේ ලිපි සෑම වසරකදීම කාර්යාංශය වෙත ලබා දී ඇති බව. | අවබෝධතා ගිවිසුම අනුව මෙම මුදල් ව්‍යාපෘතිය සඳහා යොදවා තිබේද යන්න තහවුරු කර ගත යුතු අතර, අදාළ මුදල නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2023 ජනවාරි 18 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදීද විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරින් තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව විධිමත් ක්‍රියාපටිපාටියක් සකස් කරන ලෙස නිර්දේශ ලබාදී තිබුණද 2023 ජනවාරි 17 දින අනුමත කර තිබූ ක්‍රියාපටිපාටිය අඩුපාඩු | විදේශ දූත මණ්ඩල සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය බඳවා ගැනීම පිණිස වන බඳවා ගැනීම් පටිපාටිය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2023.01.17 දින අනුමත කර කාර්යාංශය වෙත ලබා දි ඇත. කෙසේ වුවද එම බඳවා ගැනීම් පටිපාටිය යටතේ ඉල්ලුම් | අනුමත කරන ලද විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරින් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියේ පවත්නා අඩුපාඩු නිවැරදි කරවාගෙන නිලධාරීන් බඳවා |

| | | | |
|---|---|---|---|
| | පවතින බව සඳහන් කර කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. | කිරීමට JM 1-2 ශ්‍රේණියේ නිලධාරීන්ට අවස්ථාව අහිමි වී ඇති බැවින් ඒ පිළිබඳව සේවක විරෝධතාවයක් මතු වූ අතර එම ගැටළුව විසඳා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කිහිප අවස්ථාවක දී රේඛීය අමාත්‍යාංශය හරහා ලිපියොමු කර ඇති බව. | ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 15 (අ),(ඔ),(ඕ) වගන්ති අනුව සියළු තොරතුරු ඇතුළත් දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන ගොස් නොතිබුණි. | කාර්යාංශය විසින් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යනු ලබන බව. | අවශ්‍ය අවස්ථාවන්හිදී අදාළ තොරතුරු ලබා ගැනීමට හැකිවන පරිදි විගමණිකයන්ගේ සියලු තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වා ගත යුතු වේ. |
| (එ) | 2015 සිට 2022 කාල පරිච්ඡේදය තුළදී බලපත්‍රලාභී නියෝජිතායතන 04 ක් අසාධු ලේඛන ගතකර තිබියදීත් එම නියෝජිතායතන වෙත නැවතත් පැමිණිලි 315 ක් ලැබී තිබුණ ද කාර්යාංශ පනතෙහි 31 (1) වගන්තිය අනුව කටයුතු නොකරන බලපත්‍රලාභී නියෝජිතායතන අවලංගු කිරීමට හැකියාව තිබුණද එම නියෝජිතායතනයන්හි බලපත්‍ර අවලංගු කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අසාධු ලේඛනගත කර ඇති නියෝජිතායතනයන්හි බලපත්‍ර අවලංගු කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කම්කරු සුභසාධන අරමුදල මඟින් පූර්ණ ආබාධිත විගමණිකයින් සඳහා රු.මිලියනයක් වටිනා නිවාසය බැගින් තනාදීම සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුල දී රු.9,600,000ක් වෙන් කර නිවාස 04 ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භකර තිබුණ ද 2022 දෙසැම්බර් 31 දින වන විට ඉන් නිවාස 03 ක වැඩ අවසන් කර නොතිබුණු අතර රු.2,222,650 ක් වැය කර තිබුණි. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාස ඉදිකිරීමේ දී දිගින් දිගට වූ ප්‍රමාදවීම් සළකා එම නිවාස දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ අදාළ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල වල තාක්ෂණික නිළධාරීන්ගේ සහයෝගය ඇතිව ඉදිකිරීමට ගත් පියවර අනුව නිවාස 02ක් ඒ ඒ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලවල තාක්ෂණික නිළධාරී, සංවර්ධන නිළධාරී (විදේශ රැකියා) සහ කාර්යාංශයේ ජොෂ්ඨ කළමනාකරුගේ ද අධීක්ෂණය යටතේ සිදු කිරීමට කටයුතු කරන ලද බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, කාර්යාංශය විසින් දින 52ක් ප්‍රමාද වී 2023 අප්‍රේල් 21 දින මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කර අවසන් වූ පසු පැවති ප්‍රථම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම පැවති 2023.04.06 දින මෙම ගිණුම් ඉදිරිපත් කළ අතර ඉන් අනතුරුව අවශ්‍ය ලිපි ලේඛන සමඟ 2023.04.21 දින රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |